# කැලණිය අධ්‍යාපන කලාපය

දෙවන වාර පරීක්ෂණය - 2018

**11 ශ්‍රේණිය** **පුරවැසි අධ්‍යාපනය - I** කාලය පැය 1 යි

Remove Watermark Now

නම: ........................................................................ . විභාග අංකය: ................

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1) සෘජු ප්‍රජාතාන්ත්‍රවාදී ලක්ෂණ පදනම් කරගෙන පාලනය වූ ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,
1) මහ සභාවයි 2) පුරවැසි සභාවයි 3) රාජ්‍ය සභාවයි 4) නගර සභාවයි

2) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පාලන කටයුතු පවත්වාගෙන යාමේ ජනතාව සතු බලය හඳුන්වන්නේ,
1) පරමාධිපත්‍ය බලය ලෙසය 2) ඡන්දබලය ලෙසය
3) උත්තරීතර බලය ලෙසය. 4) ව්‍යවස්ථාදායක බලය ලෙසය.

3) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සෘජුවම ඡන්ද දායකයන්ගේ අදහස් විමසීමට ලක්කරන අවස්ථාවකට නිදසුනකි.
1) ජනාධිපතිවරණය 2) ජනමත විචාරණය
3) මහ මැතිවරණය 4) පළාත් සභා මැතිවරණය

4) ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු විසින් සමාජය වෙත ඉටුකළයුතු යුතුකම් වන්නේ,
1) නීතිමය හා සදාචාරාත්මක යුතුකම් 2) ආර්ථික හා සමාජ යුතුකම්
3) සිවිල් හා දේශපාලන යුතුකම් 4) සංස්කෘතික හා ආගමික යුතුකම්

5) ශ්‍රී ලංකාවේ ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා ප්‍රධාන නිර්නායක ලෙස භාවිතා කරනු ලබන්නේ,
1) ජනවර්ග හා භූමිය යි. 2) ආගම හා ජනවර්ගයි
3) ආගම හා භාෂාවයි 4) භූමිය හා ජනගහනය

6) තම දේශපාලන, ආර්ථික, සමාජීය අවශ්‍යතා ඉටුකර ගැනීමට පුද්ගලයාට සමාජයෙන් ලැබෙන ඉඩකඩ
1) සමානාත්මතාවය ලෙස හඳුන්වයි. 2) යුක්තිය ලෙස හඳුන්වයි.
3) නිදහස ලෙස හඳුන්වයි. 4) සදාචාරය ලෙස හඳුන්වයි.

7) රාජ්‍යයක පාලන කටයුතු මෙහෙයවන ප්‍රධාන ආයතනය
1) ආණ්ඩුවයි 2) පාර්ලිමේන්තුවයි
3) කැබිනට් මණ්ඩලයයි 4) විධායකයයි.

8) මධ්‍යම ආණ්ඩුව සතු ව්‍යවස්ථානුකූල බලතල වලින් කොටසක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම ප්‍රාදේශීය මට්ටමට පවරා දීම.
1) බලය බෙදා හැරීමයි 2) බලය ඒකරාශි කිරීමයි
3) බලය විමධ්‍යගත කිරීමයි 4) බලය පවරා ගැනීමයි.

9) පුරවැසි අයිතිවාසිකම් සුරැකීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ, ආරක්ෂකයකු ලෙස කටයුතු කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබන්නේ,
1) ව්‍යවස්ථාදායකයයි. 2) අධිකරණයයි
3) විධායකයයි 4) පරිපාලනයයි.

10) සන්ධීය ආණ්ඩුක්‍රමයක් පවතින රටකට නිදසුනකි.
1) මහා බ්‍රිතාන්‍ය 2) ඕස්ට්‍රේලියාව 3) ශ්‍රී ලංකාව 4) ප්‍රංශය

11) සෑම පළාත් සභාවකම මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභාව අතර සම්බන්ධීකරණය සිදුකරන නියෝජිතයා වන්නේ
1) පළාත් ආණ්ඩුකාරවරයා ය. 2) පළාත් මහ ඇමතිය
3) පළාත් සභා සභාපතිවරයා ය. 4) පළාත් ලේකම් වරයා ය.

Remove Watermark Now

12) පළාත් සභාවක මධ්‍යම ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවනු ලබන විෂය කරුණු 17 ක් සම්බන්ධ බලතල ඇතුළත් ලැයිස්තුව,
1) පළාත් සභා ලැයිස්තුව 2) විවෘත ලැයිස්තුව
3) සංවෘත ලැයිස්තුවයි 4) සමගාමී ලැයිස්තුවයි

13) ප්‍රාදේශීය සභාවක ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ
1) ලේකම්වරයා ය. 2) ඇමතිවරයා ය.
3) මන්ත්‍රීවරයා ය. 4) සභාපතිවරයා ය.

14) සන්ධීය රාජ්‍යයක බලය බෙදාහැරීම සිදුවන්නේ
1) මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩුව අතරය
2) මධ්‍යම ආණ්ඩුව සහ ප්‍රාන්ත ආණ්ඩුකාරවරයා අතරය.
3) ජනාධිපති හා මධ්‍යම ආණ්ඩුව අතරය
4) ජනාධිපති හා ප්‍රාන්ත ආණ්ඩු අතරය.

15) ස්විස්ටර්ලන්තයේ සන්ධිය ක්‍රමයේ දේශපාලන ව්‍යුහය තුළ ''කැන්ටන්'' සතු බලතල අයත්වන විෂයයන් වන්නේ,
1) අධ්‍යාපනය උසස් අධ්‍යාපනය 2) ආරක්ෂක හා හමුදා කටයුතු
3) යුද්ධය හා සාමය ප්‍රකාශ කිරීම 4) විදේශ රටවල් හා ගිවිසුම්වල එළඹීම.

16) බහු සංස්කෘතික සමාජයක පුරවැසියකුගේ වගකීම වන්නේ
1) විවිධ සංස්කෘතීන් මිශ්‍රවීම වැළැක්වීමට කටයුතු කිරීමයි.
2) වැඩිපිරිසක් අයත්වන සංස්කෘතියට අනුගතව කටයුතු කිරීමයි.
3) සියලුම සංස්කෘතීන්ට ගරු කරමින් සමානව සැළකීමයි.
4) තමන්ගේ සංස්කෘතීන් ඉස්මතු වන සේ කටයුතු කිරීම ය.

17) නූතන ජාතික රාජ්‍ය සංකල්පයේ අදහස එක් ජාතියකට එක් රාජ්‍යයක් යන්නයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ විවිධ සංස්කෘතීන්ට අයත් ජීවත් වූවත් ඔවුන් සියලු දෙනාම,
1) සිංහලයෝ වෙති 2) දමිළයෝ වෙති
3) මුස්ලිමානුවෝ වෙති 4) ශ්‍රී ලාංකිකයෝ වෙති.

18) මිනිස් අවශ්‍යතා ඉටුකර ගැනීමට යාමේදී ගැටලු මතුවීමට ප්‍රධාන හේතුවක් වන්නේ
1) අවශ්‍යතා පිරිමසා ගැනීමට අවශ්‍ය සම්පත් සීමිත වීමයි.
2) පුද්ගලයාගෙන් පුද්ගලයාට අවශ්‍යතා වෙනස් වීමයි.
3) අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය දැනුම ප්‍රමාණවත් නොවීමයි.
4) අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවීමයි.

19) ප්‍රාග්ධන සූක්ෂම ශිල්පීය ක්‍රම භාවිතය යනුවෙන් අදහස් කරනුයේ,
1) භාණ්ඩ බෙදා හැරීමේදි යන්ත්‍ර සූත්‍ර බහුලව යොදා ගැනීමයි.
2) භාණ්ඩ නිෂ්පාදනයේදි යන්ත්‍ර සූත්‍ර බහුලව යොදා ගැනීමයි.
3) භාණ්ඩ බෙදාහැරීමේ දී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.
4) භාණ්ඩ නිශ්පාදනයේදී මිනිස් ශ්‍රමය බහුලව යොදා ගැනීමයි.

20) මිනිස් වුවමනා හා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යම්කිසි මිලක් ගෙවා ලබාගන්නා භාණ්ඩ
1) ප්‍රාග්ධන භාණ්ඩ වේ. 2) නිශ්පාදන භාණ්ඩ වේ
3) ආර්ථික භාණ්ඩ වේ. 4) අන්තර් භාණ්ඩ වේ.

21) සමාජවාදී වෙළෙඳපොළ ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ලැබෙන රටකි.
1) රුසියාව 2) සිංගප්පූරුව
3) කියුබාව 4) ඔස්ට්‍රේලියාව

22) තිරසාර සංවර්ධනයේ ප්‍රධාන අරමුණ වන්නේ,
1) මනුෂ්‍ය අන්තර් ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍ය මානව හා භෞතික ප්‍රාග්ධනය සැපයීමයි.
2) ස්වභාවික සම්පත් කළමණාකරණය කර ගනිමින් මිනිස් අවශ්‍යතා හා බලාපොරොත්තු ඉටු කිරීමයි.
3) නවීන තාක්ෂණයත් සමග ලෝකයේ සෙසු රටවල් අභිබවා ඉදිරියට ගමන් කිරීමයි.
4) සමාජයේ පවතින විවිධ සංස්කෘතික අංක පරිසරය සමග සංශෝධනය කිරීමයි.

Remove Watermark Now

23) ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට අත්වී තිබෙන සෘණාත්මක බලපෑම දක්වෙන පිළිතුර තෝරන්න.

A ආර්ථිකය විවිධාංගීකරණය වීම.

B සංවර්ධිත රටවලින් සිදුවන බලපෑම ඉහළයාම.

C දේශීය යැපුම් ආර්ථික රටාව විනාශවී යාම.

D නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම් පුලුල් විම.

1) A, B 2) A, C 3) B, D 4) B, C

24) ගැටුම් නිරාකරණයේදී අනුගමනය කළ යුතු වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ,
1) ගැටුම්වලින් මගහැර යාමට ක්‍රියා කිරීමයි.
2) ගැටුමට මුල් වූ සාධක මුලිනුපුටා දැමීමට ක්‍රියා කිරීමයි.
3) ආරක්ෂක කටයුතු කරකොට ගැටුම් ඇතවීම වැළැක්විමයි.
4) සාකච්ඡා සඳහා තුන්වන පාර්ශවයක් සහභාගී කරවා ගැනීමයි

25) නීතියේ ප්‍රධාන පරමාර්ථය වන්නේ,
1) ජනතාවගේ ආරක්ෂාව සහතික වන ආකාරයට පාලනය මෙහෙයවීමට මගපෙන්වීම.
2) ජනතාවගේ ජීවිත. දේපළ හා අයිතිවාසිකම් රකෙන සේ මානව හැසිරීම් පාලනය කිරීමය.
3) ජනතාව තුළ නීතිය පිළිබඳ දැනුම තහවුරු කිරිමයි.
4) සමාජයේ වැරදිකරන පුද්ගලයන් සියලුදෙනා අධිකරණයට පැමිණවිමයි.

26) රටක නීතියක් ක්‍රියාත්මක විම ආරම්භ වන්නේ,
1) පාර්ලිමේන්තුවේදි පනත් කෙටුම්පතත් සම්මත විමෙන් පසුවය.
2) පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පනත් කෙටුම්පතකට ජනාධිපතිවරයා අත්සන් තැබීමෙමි පසුවය.
3) පාර්ලිමේන්තුවෙන් සම්මත වූ පනත් කෙටුම්පතකය කතානායකවරයා අත්සන් යෙදීමෙන් පසුවය.
4) පනත් කෙටුම්පතට ශ්‍රේෂ්ඨාධිකරණයේ අනුමැතිය ලැබීමෙන් පසුවය.

27) ශ්‍රී ලංකාවේ ඉහළම උසාවියකින් දෙනු ලබන තීන්දුවකට එරෙහිව එංගලන්තයේ රාජාධිකරණය වෙත අභියාචනා කිරීමේ බලය අහෝසි කරනු ලැබුයේ,
1) 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළිනි
2) 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළිනි.
3) 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළිනි.
4) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළිනි.

28) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රධාන නීති නිලධාරියා වන්නේ
1) අග්‍ර විනිශ්චයකාරතුමාය 2) නීතිපති තුමාය.
3) කතානායක තුමාය 4) සොලිසිටර්තුමාය.

29) මහාධිකරණය සතු බලතල දෙකක් ඇතුළත් පිළිතුර තෝරන්න.

A) දරුකමට හදා වඩා ගැනීමට ඉල්ලීම

B) ශ්‍රී ලාංකිකයකු පිටරටකදි කරන ලද වැරදි සම්බන්ධව ක්‍රියා කිරීම.

C) උප්පැන්න සහතිකයේ නම වෙනස් කිරීම සහා ඉල්ලීම

D) රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ

1) A, D 2) B,C 3) A, C 4) B,D

30) කාර්මික ආරවුල් පනතේ 15 (අ) වගන්තියේ සිට 21 වන වගන්තිය දක්වා වූ විධි විධාන අනුව කාර්මික ආරවුල් සමථයකට පත් කිරීමේ ක්‍රියාවලිය.
1) සමථකරණය යනුවෙන් හඳුන්වයි. 2) විනිසීම යනුවෙන් හඳුන්වයි.
3) බේරුම්කරණය යනුවෙන් හඳුන්වයි. 4) උපදේශනය යනුවෙන් හඳුන්වයි.

31) අධිකරණ සේවා කොමිසමේ සභාපති ධූරය දරනු ලබන්නේ
1) නීතිපතිවරයා ය. 2) අධිකරණ ඇමති ය.
3) සොලිස්ටර් ජෙනරාල් වරයාය. 4) අග්‍රවිනිශ්චයකාරවරයාය.

Remove Watermark Now

32)

- විධායක බලය සහිත ජනාධිපති ධුරයක් ඇති කිරීම.
- සමානුපාතික නියෝජන ක්‍රමය හඳුන්වා දීම.
- පාර්ලිමේන්තු කටයුතු කොමසාරිස් ධුරයක් ඇති කිරීම.

ඉහත සඳහන් වෙනස්කම් කරන ලද්දේ කවර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද?

1) 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාව
2) 1972 පළමු ජනරජ ව්‍යවස්ථාව
3) 1947 සොල්බරි ව්‍යවස්ථාව
4) 1931 ඩොනමෝර් ව්‍යවස්ථාව

33) මහ නගර සභා නගර සභා ප්‍රාදේශීය සභා ප්‍රකාශයට පත් කිරීම සීමාව නිශ්චය කිරීම, නමක් නියම කිරීමේ බලය හිමිවන්නේ,

1) විෂයභාර ඇමතිවරයාටය 2) ජනාධිපතිවරයාටය
3) අගමැතිවරයාටය 4) කතානායකවරයාටය

34) මරණ දඬුවම අහෝසි කිරීමේ අරමුණ ඇතිව සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සම්මත කරනු ලැබූයේ,

1) 1989 දී ය. 2) 1979 දී ය.
3) 1978 දී ය. 4) 1998 දී ය.

35) පහත සඳහන් අයිතිවාසිකම් වලින් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් දැක්වෙන පිළිතුර තෝරන්න.

A) නිදහස් මත දැරීමේ හා ප්‍රකාශ කිරීමේ අයිතිය
B) සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
C) විදේශයක ආරක්ෂාව ලැබීමේ අයිතිය
D) වෘත්තීය සමිති පිහිටුවා ගැනීම හා ඒවාට සම්බන්ධවීමට ඇති අයිතිය

1) A, D 2) A,C 3) B, C 4) B,D

36) බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවෙන් අග්‍රාණ්ඩුකාර ධුරයක් ඇති කිරීමට සිදුකරන ලද්දේ,

1) 1931 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි
2) 1972 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි
3) 1947 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.
4) 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය මගිනි.

37) රාජ්‍යයක උත්තරීතර ලේඛනය මෙන්ම නීතිය ද වන්නේ,

1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. 2) හැන්සාඩ් වාර්තාවයි
3) ආයතන සංග්‍රහයයි 4) මුදල් රෙගුලාසි වර්තාවයි.

38) ශ්‍රී ලංකාවේ මහෙස්ත්‍රාත් අධිකරණ තීන්දුවලට එරෙහිව අභියාචනා කළ හැකි වන්නේ,

1) දිසා අධිකරණයටය 2) මහාධිකරණයටය
3) අභියාචනාධිකරණයටය 4) පළාත් බද මහා අධිකරණයට

39) පහත සඳහන් ''අ'' සහ ''ආ'' ප්‍රකාශ එකිනෙක ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | | | |
|---|---|---|---|
| 1) | රාජ්‍ය මන්ත්‍රණ සභාව | A | 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| 2) | ද්විමණ්ඩල පාර්ලිමේන්තුව | B | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| 3) | ජාතික රාජ්‍ය සභාව | C | 1931 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |
| 3) | පාර්ලිමේන්තුව | D | 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව |

1) C, A,B,D 2) C, A ,D ,B 3) B, C, A,D 4) D,B,AC

40) වර්තමානයේ ක්‍රියාත්මක වන නව-ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ක්‍රමයක ලක්ෂණ දැක්වෙන පිළිතුර තෝරන්න.

A) වෙළෙඳ පොළමත භාණ්ඩවල මිල තීරණය වුව ද රජය ඒ සඳහා මැදිහත් වීම.
B) වෙළඳපොළ තත්තවය මත මිල තීරණය වීමට ඉඩ සැලසීම.
C) පොදු යහපත සඳහා සුභ සාධක කටයුතු කිරීමට රජය මැදිහත් වීම.
D) සහනාධාර හා මිල පාලන ක්‍රම ලිහිල් කිරීම.

1) AC 2) BC 3) AD 4) BD

Papers.lk
PDFelement